

# හතර කේන්ද්‍රය පාළු වීම

ධම්මික විජේසිංහ
සුබෝධා ජ්‍යෝතිශ සේවය මෙල්බර්න්

සමාජය තුල මුල් බැස ඇති විවිධාකාර වු මති මතාන්තර අනුව "හතර කේන්ද්‍රය පාළු වීම" ගැන හා එබඳු කේන්ද්‍ර දායාද කොට උපන් අයවළුන් පිළිබඳව ඇත්තේ අශුභවාදී ආකල්පය.

හතර කේන්ද්‍රය හිස් වුවන් ගිහි ජිවිතයට වඩා පැවිදි බිමට යෝග්‍ය බවට ඇති මතය නිසා තම දරුවකුගේ කේන්ද්‍රය එබඳු වුවහොත් කම්පාවට පත්වන දෙමාපිය සංඛ්‍යාව අනල්පය. එයට හේතුව අද පවත්නා තරඟකාරී සමාජය තුල හොඳින් ඉගෙන ගෙන, ඉහළ රැකියාවකට පත්ව තනතුරු ලබමින් විවාහ වී දරුමල්ලන් ලැබ සුළු පහසු දිවි පෙවතක් ගත කරන දරුවකු දැකීම ඉහළම භාග්‍යයක් සේ සලකනු ලැබීමයි.

මේ පිළිබඳව විස්තර කිරීමට පෙරාතුව කේන්ද්‍ර සටහනේ ස්ථාන ගැන මුලික වශයෙන් විස්තර කිරීම වැදගත් වේ.




| | | |
|---|---|---|
| 1, 4, 7, 10 | - | කේන්ද්‍ර ස්ථාන (හතර කේන්ද්‍රරේ) |
| 2, 5, 8, 11 | - | පණ පර ස්ථාන |
| 3, 6, 9, 12 | - | අපොකලිම ස්ථාන |
| 5, 9 | - | ත්‍රිකෝණ ස්ථාන |
| 4, 8 | - | චතුරස්‍ර ස්ථාන |
| 2, 7 | - | මාරක ස්ථාන |
| 3, 8 | - | ආයු ස්ථාන |
| 6, 8, 12 | - | දුෂ්ට ස්ථාන (ත්‍රික යනුවෙන්ද හැඳින්වේ) |
| 3, 6, 10, 11 | - | උපචය ස්ථාන |

(ඉතිරි ස්ථාන 8 අපචය වේ)

අපොකලිම ස්ථාන වලට වඩා පණ පර ස්ථානද, ඊට වඩා කේන්ද්‍ර ස්ථානද පිළිවෙලින් බලවත්ය.

උපමය ස්ථාන වල සිටින ග්‍රහයෝ ශුභ හෝ අශුභ හෝ පල නොදී නොයති.

ත්‍රිකෝණ ගත ග්‍රහයෝ බොහෝවිට ශුභ පල දෙති. අශුභ පල දෙන්නේ අඩුවෙනි.

දැන් නැවතත් හතර කේන්ද්‍ර ස්ථාන ගැන සලකා බලමු. ඒ අනුව පිළිවෙලින්,

1 වැන්න - ලග්නස්ථානය තුලින් සිතුම් පැතුම්, එඩිතර බව
4 වැන්න - ගේ දොර, ඉඩකඩම්, පවුල, ස්ථානය, ස්ථානමාරු
7 වැන්න - විවාහය, විවාහ සහකරු/සහකාරිය, විවාහයෙන් පසු දිවිය
10 වැන්න - රැකියාව, රැකියා වෙනස්වීම, පියාගේ කටයුතු ඉදිරියට ගෙන යාම ආදි වශයෙන්ද නියෝජනය වේ.

මේ කරුණු අනුව පැරැන්නෝ කේන්ද්‍ර ස්ථාන වල ග්‍රහයින් නොමැති අය ගිහි ජිවිතයට වඩා පැවිද්දට යෝග්‍යය යැයි පවසා ඇත. යථෝක්ත මතය ඇති වීමට ඉවහල් වු කරුණ එයයි.

නමුත් ඒ අයගේ කේන්ද්‍ර ස්ථාන වලට වැටෙන ග්‍රහයන්ගේ දෘෂ්ටි, කේන්ද්‍ර ස්ථාන අධිපති ග්‍රහයන්ගේ පිහිටීම් ආදියට අනුව ඉහත කී මතය උඩු යටිකුරු වන අවස්ථා එමටය.

හතර කේන්ද්‍රය පාළු හෙවත් ග්‍රහයින් නොමැතිව හිස්ව පවතින කේන්ද්‍රර වල දක්නට හැකි සිද්ධාන්තමය හා ප්‍රායෝගික ලක්ෂණත්, දෘෂ්ටි හා ග්‍රහ පිහිටීම නිසා ඇතිවිය හැකි බලපෑම්ද සම්පිණ්ඩනය කොට පහත දැක්වෙන ලෙස ප්‍රායෝගික අත් දැකීම් පෙළ ගැස්විය හැක.

හතර කේන්ද්‍රය පාළු ගැහැණු අයට වඩා පිරිමි අයට ශ්‍රවණ යෝගය ඉස්මතු වන අවස්ථා වැඩිය.

හතර කේන්ද්‍රය පාළු අය ඉගෙනීමට ස්වභාවයෙන්ම දක්ෂයෝ වෙති.

වෛද්‍ය, ඉංජිනේරු, නීතිඥ, විධායක තනතුරු



වැනි ඉහළ රැකියාවලත්, එම තනතුරුවල විශේෂඥ භෘවයට පැමිණි විනිශ්චය කරුවන්, මහාචාර්යවරු, විශේෂඥ වෛද්‍යවරු ආදිනුත් බොහෝවිට මෙවැනි කේන්ද්‍ර වලට හිමිකම් ලැබුවෝ වෙති.

හතර කේන්ද්‍රයට උච්ච බලයෙන් යුතුව දෘෂ්ටි ලබාදෙන ගුරු, කුජ, ශනි, රාහු යන ග්‍රහයන්ගේ බලපෑම මත කේන්ද්‍ර හිමියාගේ ජිවිතයේ සුවිශේෂ වෙනස්කම් ඇතිවේ.

හතර කේන්ද්‍ර ස්ථානවලට ඉතා ආසන්නව ප්‍රධාන ග්‍රහයකු හෝ ග්‍රහයින් කිහිපදෙනෙකු සිටින විටෙකද ඉහත දැක්වු ලෙසම වෙනස්කම් ඇතිවේ.

"එකශ්‍රැතිධර යෝගය", "සිංහාසන යෝගය" වැනි ඉතා සුභ යෝග පිහිටි අයගේද හතර කේන්ද්‍රය හිස්වීම අනිවාර්යයෙන්ම සිදුවේ. එමෙන්ම "වාපී යෝගය" වැනි මධ්‍ය සුභ පල යෝග පිහිටන විටද නියත වශයෙන් හතර කේන්ද්‍රය පාළු වීම සිදුවේ.

හතර කේන්ද්‍රය හිස්වීම පිළිබඳව වු මත හා එබඳු කේන්ද්‍ර හිමියන්ගේ යථෝක්ත වු ප්‍රායෝගික පැවැත්මත් සසඳ බැලීමේදී කිව හැක්කේ උඩින් බලා එබඳු මත දැරීම නොකල යුක්තක් බවයි.

අතීතයේදී හතර කේන්ද්‍රය හිස් වු පිරිමි දරුවකු ඉපිද ඔහුව මහණ කිරීමට දෙමාපියන් අකමැති වු විට, දෙං හරණ පිළිවෙතක් ලෙස දරුවාව කුඩා කාලයේ පන්සලට බාර දීම (අතපැන් වත්කොට ශාසනයට පුජා කිරීම) සිදු කර ඇති බව පෙනේ. ඒ ඔහුට සාර්ථක ගිහිජිවිතයක් ලබා දීමට සෙත් ශාන්තියක් වශයෙනි.


# Keilor medical clinic

## Bulk billing (GP clinic)

Female and Male doctors Available



- Family medicine & Women's Health
- Travel Vaccination
- Flu Vaccine
- Physiotherapy
- Onsite pathology services

Call us today for an appointment
No Waiting Time

03 94494655
870 Old Calder Hwy,
Keilor, Vic 3036

Dr.Kingsley Joseph
වෛද්‍ය කිංස්ලි ජෝසප් මහතා
General Practitioner

Dr.Ivan S.Senanayake
වෛද්‍ය අයිවන් සේනානායක මහතා
General Practitioner

Dr.Satya Inumala
වෛද්‍ය සත්‍යා මහත්මිය
General Practitioner

Dr. Ransimala Samarakoon
වෛද්‍ය රන්සිමාලා සමරකෝන් මහත්මිය
General Practitioner

Dr. Saliya Kumarasinghe
වෛද්‍ය සාලිය කුමාරසිංහ මහතා
General Practitioner

Dr. Hiran Fernando
වෛද්‍ය හිරාන් ප්‍රනාන්දු මහතා
General Practitioner

Open 7 days till late night
Monday – Friday : 8:30am – 10:00pm
Saturday and Sunday: 8:30am – 6:00pm

friendly staff and high end technology to treat patients.
Overseas students and visitors who has insurance to claim the whole amount back
There is no gap payment.

In addition, The principal GP, Dr.Kingsle Joseph serve our community in Following locations

1 .Alpha Medical Clinic
351 Childs Rd Mill Park
03 94044888

2 Wells Medical Clinic
176, Blair Street Broadmedows
03 93021580